# ලංකා ඉතිහාසයෙහි යටත් විජිත යුගයේ ඇති වූ බෞද්ධාගමික පුනරුදය

කථිකාචාර්ය අජිත් තල්වත්ත

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අංශය

මෙම අධ්‍යයනයේ අවධානය යොමුකරනු ලබන්නේ පෘතුගීසි හා ලන්දේසි යුගයේ දී භික්ෂු ශාසනයේ ක්‍රියාකාරිත්වය "යටත් විජිත යුගයේ ඇති වූ හෙළ බොදු පුනරුදයට කෙසේ බලපෑවේ" ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහාය.

රාජ්‍ය පාලකයා ප්‍රමුඛ ප්‍රභූන් බුදුදහම වැළඳ ගැනීමෙන් ඔවුන්ගෙන් ලැබුණු අනුග්‍රහයත් නිසා රට පුරා බුදුදහම ව්‍යාප්ත වූ අතර ඉදි වූ බෞද්ධ විහාරාරාම ඒවායේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලාගේ ශාසනික මෙහෙවරත් නිසා සිංහලයාගේ ජීවන රටාවෙන් වෙන් කළ නොහැකි අන්දමින් ස්ථාපිත විය. දළදාව ශ්‍රී මහා බෝධිය, පාත්‍රා ධාතුව මෙරට සිංහල ජන සමාජය හා සමීපව පැවතුණි. දිගින් දිගටම ලැබුනු රාජකීය අනුග්‍රහය යටතේ ශතවර්ෂ ගණනාවක් රක්ෂිතව පෝෂණය වූ බුදු සසුන ලංකා ජනජීවිතයෙහි ජීවනාලිය බවට පත්විය. භික්ෂූන් වහන්සේවත් උන්වහන්සේගේ ආධිපත්‍යයත් රජුගේ අණසක පවා අභිබවන්නට සමත්විය.

බුද්ධාගම සිංහල දේශයේත් සිංහල ජාතියේත් උරුමය ලෙසත් ජාතික ආගම ලෙසිනුත් ස්ථිර විය. බුද්ධාගම ස්ථාපිත වූ අවධියේ සිට ම සිංහල රාජ්‍යයේ අවසානය වූ 19 වන ශතවර්ෂය දක්වා දීර්ඝ කාලය තුළ සිහසුනෙහි උරුමය බෞද්ධයකුට මිස වෙන කිසිවෙකුට හිමි නොවන බව සිංහලයන්ගේ පිළිගැනීම විය. ලක්දිව රජ වීමට මහා සංඝයාගේ අනුමැතිය ද අවශ්‍ය විය. 19 වන ශතවර්ෂයේ දී ඔටුණු පැළඳීම ආගමික කෘතියක් හැටියට සංඝයා ඉදිරියෙහි විහාරයේ දී සිදුකරනු ලද බැව් මහාවංශයේ සඳහන් වේ. [1] ඉන්දියාවෙන් ලක්දිවට ලැබුණු ශ්‍රී මහා බෝධිය, පාත්‍ර ධාතුව, දන්ත ධාතුව, කේශ ධාතුව ආදී සියලුම වස්තූන්

1. මහා වංශය පිටුව 82

සිංහලයන්ට අයිති ජාතික වස්තූන් ලෙස ආරක්ෂා කැරිණි. ආගමත්, ජාතියත්, රාජ්‍යයත්, එක්වීම නිසා රටේ පාලන කටයුතුවලට ද ජාතියේ නිදහසට හා ආරක්ෂාවට ද භික්ෂූන් වහන්සේලා සහභාගි වූහ. [2] රොබට් පර්සිවල් විසින් තම කෘතියේ භික්ෂූන්වහන්සේලාගේ වැදගත්කම පෙන්වා ඇත. [3] එනම් ජන සමාජයේ උත්තරීතර තැනැත්තා වූයේ භික්ෂුවයි. මහජන මතය මහාසංඝයාගේ උපකාරයෙන් යැයි ඔහු පෙන්වා ඇත. මේ අනුව භික්ෂූන්වහන්සේ පාලන තන්ත්‍රය තුළ කුමන කාර්ය භාරයක් ඉටු කරනු ලැබුවේ දැයි අවබෝධ වේ. සිහසුන උදෙසා භික්ෂූන්වහන්සේ සතුව පැවති අධිකාරි බලය ඉන් මනාව ගම්‍ය වේ. රාජ්‍ය කටයුතුවල පමණක් නොව සමාජමය ජීවිතයේදී ගිහියන්ගේ සෑම අවශ්‍යතාවක දී ම උන්වහන්සේගේ දායකත්වය ඉතා වැදගත් විය. මේ ආකාරයට අනුරාධපුර අවධියේ සිට කෝට්ටේ යුගය දක්වා කාලය තුළ භික්ෂූන් වහන්සේ විසින් ජන සමාජයෙහි ඉතා වැදගත් ප්‍රසංශනීය .කාර්යය භාරයක් ඉටුකරනු ලැබිණි.

ක්‍රි. ව. 1505 දී සිදු වූ පෘතුගීසි ආගමනයත් සමග භික්ෂූන්වහන්සේ රාජාණ්ඩුව හා සිංහලයා අතර පැවති සම්බන්ධාව ක්‍රමයෙන් දෙදරා යන ලකුණු පහළ වන්නට විය. බොහෝ දුරට අභ්‍යන්තර දේශපාලන ස්ථාවර භාවයක් නොවුනු අතර කෝට්ටේ රජු ලංකාවේ අගරජු හැටියට සම්මත වූ වූ නමුත් ප්‍රාදේශීක රජුන් හා අගරජු තුළ ස්ථාවර සම්බන්ධතාවයක් හෝ සමගියක් නොපැවතුණේය. [4] මෙම තත්වය තුළ රටේ දියුණුවට අවශ්‍ය දේ කිරීමට රජුන්ට ශක්තියක් හෝ අවකාශයක් නොවූ අතර රටේ ආර්ථික තත්ත්වය ද ක්‍රමයෙන් පිරිහෙන්නට විය. මෙසේ රටේ වර්ධනය වූ පසුගාමී තත්වය නිසා ශාස්ත්‍රීය කටයුතු අතින් අභිවෘද්ධියක් ඇති නොවීය. දිවයිනේ දේශපාලනික ආර්ථික හා ශාස්ත්‍රීය පරිහානියක් සමග බුද්ධාගමේ හා භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය දුර්වල විය.

රටේ පැවති අස්ථාවර තත්ත්වයත් පාලකයින්ගේ දුර්වලතාවත් නිසා පෘතුගීසීන්ට මෙරට අභ්‍යන්තර පරිපාලන කටයුතුවලට අත පොවන්නට හැකිවීමත් සමග දිනෙන් දින ම බුදුසසුන හුදකලා වන්නට විය. පෘතුගීසින්ට එක් අරමුණක් වූයේ ක්‍රිස්තියානි ආගම මෙරට ව්‍යාප්ත කිරීමය කොළඹ පානදුර, මග්ගොන, බේරුවල, ගාල්ල, වැලිගම ආදී මුහුදුබඩ පළාත්වල පෘතුගීසින්ගේ කතෝලික ආගමත් පැතිරෙන්නට විය.

ආගම ව්‍යාප්ත කිරීම තම දෙවියන් වහන්සේ වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමක් සේ සිතමින් ස්වකීය ආගම ව්‍යාප්ත කරන ගමන් දේශීය ආගම විනාශ කිරීමේ

2. රාහුල හිමි වල්පොල, භික්ෂුවගේ උරුමය ගොඩගේ සහෝදරයෝ, කොළඹ 1992 පිටු 20
3. Persimel R. **An. Account of Island of Ceylon** 1803. P. 201
4. භික්ෂුවගේ උරුමය, පිටු 63

ව්‍යාපාරයක ද යෙදුණු පෘතුගීසිහු බෞද්ධ වෙහෙර විහාර වනසමින් ! බෞද්ධ භික්ෂූන් වහන්සේලාට තාඩන පීඩන කර භීෂණයක් නිර්මාණය කළහ.[5] හත්වන බුවනෙකබාහු රජතුමා (1521-1551) ක්‍රිස්තියානි පූජකවරුන්ගෙන් සිදුවූ බලපෑම් නිසා කෝට්ටේ රාජධානියේ ක්‍රිස්තියානි පූජකයන්ට ප්‍රියමනාව වූ උරුම කරුවකු බලයට පත් කිරීමට ද උත්සාහ ගත්තේය. පසුව ධර්මපාල බෞතිස්ම කිරීමට ද, පූජකවරු නොබෝ කලකින් සමත් වූහ. මේ අනුව අභිෂේකය ලද රජතුමා බෞද්ධාගමේ ආරක්ෂාව හා ප්‍රධාන අනුග්‍රාහක තත්ත්වයෙන් ඉවත් වී කතෝලික ආගම පෝෂණය කර අවසානයේ කෝට්ටේ රජකම් පවා පෘතුගීසි රජුට තෑගි ඔප්පුවකින් පැවරීමට ද, කැමැත්ත පළකර තිබේ. ධර්මපාල රජු බෞතිස්ම වීමත් සමගම සිදුවූයේ එතෙක් බෞද්ධ විහාර සතු ඉඩකඩම් හා ධන ධාන්‍ය ආදිය ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය සඳහා පූජකවරුන් වෙත පැවරීමයි. ඒ සමග ම මෙතෙක් සිංහල ජනතාවගේ නොමඳ ගෞරවයට පාත්‍ර වූ දළදා මැදුර ශාන්ත ෂේවියර් මුනිතුමාගේ පල්ලිය බවට පත්විය.[6] සුවිසල් විහාරාරාම බුදු පිළිම කඩා දමා කතෝලික පල්ලි බවට පූජකයන් විසින් පරිවර්තනය කරන ලදී. කැළණිය වැනි අතිශයින් පූජනීය ස්ථාන විනාශ කොට දමා ඒවා සතු දේපල පැන්සිස්කානු පූජකයන්ට පැවරිය.[7] ඒවාගේ ම වත්තල සිරිසඟබෝ පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන, තොටගමුවේ විජයබා පිරිවෙන ඇතුලු මහා පිරිවෙන් විනාශ කොට එහි තිබූ වස්තුව කොල්ලකෑමෙහි යෙදුණු සොල්දාදුවෝ කතෝලික පූජකවරුන්ගේ උසි ගැන්වීම නිසා වෙරළබඩ පිහිටි විහාර දේපල විනාශ කළහ. කැළණි රජමහා වාහාරය, මුල්කිරිගල, කනගල, ගෝන්නගිරි රජමහා විහාරය නාගදීප විහාරය ආදී කොල්ලකන ලද ඒවා විය.[8]

මේ ආකාරයට බුදු සසුනට නොයෙක් කෙනෙහෙලිකම් සිදුවෙද්දී අසරණ වූ භික්ෂූන් වහන්සේලාට සීතාවක රාජධානිය යටතේ ආරක්ෂාව සැපයිණි. මායාදුන්නේ යටතේ බුදුදහමට රැකවරණයක් ලැබුණ ද, බෞද්ධාගම හැර දමා හින්දු ආගම වැළඳ ගත් පීතෘ ඝාතක පළමුවන රාජසිංහ රජුගේ කාලයේදී ඇති වූ භයානක යුද්ධ නිසාත් රජුගේ දරුණු සහැසිකම් නිසාත්, බෞද්ධාගමටත්, භික්ෂූන් වහන්සේටත් බරපතල හානි සිදුවිය. මහාවංශයෙහි ද, රාජසිංහ රජතුමා බෞද්ධ විරෝධී ක්‍රියාවල නිරත වූ බවට සාක්ෂි ඇත.[9] රාජසිංහ රජුට එරෙහිව කුමන්ත්‍රණය කළ

---

5. Ribeiro R. Historic Trayedy of the Island, 1948 P. 75
6. ධර්මදස්සී ආණමඩුවේ ප්‍රබුද්ධ 2, සමයවර්ධන, කොළඹ, 2000, පිටු 273
7. Hara ndo A. H. Buddism in Sri Lana the sevententh and eighteenth centuries, Tisara 1985, p, 27
8. The Historic Tragedy of the Island in Ceylon P, 75
9. භික්ෂුවගේ උරුමය පිටු 64

භික්ෂූන් වහන්සේලා චෝදනා විභාගයෙන් වැරදි කරු වූ විට සීතාවක ගඟේ "කණා මැදිරියන් වලේ" ගිල්වා එම සංඝයා වහන්සේලා සතු පන්සල් හා ශ්‍රී පාදස්ථානය ආදී ස්ථාන අරිට්ඨ කිවෙඩු පෙරුමාල් ප්‍රමුඛ ඉන්දියානු තන්ත්‍රයානික බ්‍රාහ්මණ පූජකයන්ට පවරා දී ඇත. මෙසේ රජු බොහෝ භික්ෂූන් ඝාතනය කර ශාස්ත්‍රීය පොත්පත් රාශියක් පුළුස්සා දැමීය. කෝට්ටේ ප්‍රදේශයේ බෞද්ධ කටයුතු අඩාල වීම භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් උපැවිදි වීමත් සංඝ ශාසනය තුළ උපසම්පදා කර්මය නොපැවැත්වීමක් ද සිදුවිය.

සීතාවක රාජසිංහ රජතුමා මියයාමත් සමග ම රාජ්‍යයේ ඇතිවූ බල අරගල ප්‍රයෝජනයට ගත් ප්‍රතිකාල්දූ ධර්මපාලගේ නාමයෙන් ඒවා කෝට්ටේ රාජධානියට ඈඳා ගැනීමට ක්‍රියා කළහ. මේ නිසා බෞද්ධයිනට පහතරට ප්‍රදේශවල ආරක්ෂාවක් නොවී ය. මෙම අවධිය වන විට මහනුවර රාජධානියේ වැදගත්කම ඉස්මතු වූ අතර පළමුවන විමලධර්මසූරිය බලයට පත්වීමත් සමගම ඔහු සිංහල ජාතියේත් බෞද්ධාගමේත් ආරක්ෂකයා බවට පත්විය. මෙයින් පසු සීතාවක රාජධානියේ අවතැන් වූ භික්ෂූන් වහන්සේලා කන්ද උඩරට රාජධානියේ බල ප්‍රදේශය තුළ ඒකරාශි වූහ.

රාජාණ්ඩුව, සිංහල ජන සමාජය හා සංඝයා වහන්සේලා අතර පැවති සම්බන්ධතාව මෙසේ පසුබෑමකට ලක් වුව ද, උඩරට රාජ්‍යය ප්‍රමුඛ වීමත් සමග යලි ගොඩනැගෙන්නට විය. ප්‍රතිකාලුන් විසින් පහතරට ප්‍රදේශයේ විනාශ කළ බෞද්ධ ආයතන යලි ගොඩනගන්නට විය. මෙලෙස ආගම ඉතා වැදගත් කොට සැලකූ විමලධර්මසූරිය රජතුමා පුරාණයේ සිට ලංකා රාජ්‍යය උරුමයේ සංකේතය වශයෙන් පිළිගැණුනු දළදා වහන්සේ දේල්ගම විහාරයෙන් සෙංකඩගල පුරවරයට වැඩම කරවිය. රජ මාළිගය අභ්‍යන්තරයේ මාළිගාවක් ඉදිකොට දළදා වහන්සේ එහි වඩා හිඳුවා පුද පූජා පැවැත්විය. බදුල්ලේ, දෙවනගල ආදී විහාර රාමවලට ගම්වර පූජාකර රාජ්‍ය අනුග්‍රහය ලබා දී ඇත. එනමුත් බෞද්ධාගම සම්බන්ධයෙන් සලකා ලබන විට විමලධර්මසූරිය රාජ්‍ය කාලය තුළ ලංකාවේ භික්ෂු සාසනයේ ප්‍රබල පරිහානියක් පැවති බව පෙනේ. [10] පහතරට ප්‍රතිකාල් බලය ස්ථාවරවීමත් සමග භික්ෂූන් වහන්සේලාට සිවුරුදරා ආගමික කටයුතු වල නිරතවීම තහනම් විය. ප්‍රැන්සිස්කන් පූජකවරු ප්‍රතිකාල් ආධාරයෙන් බෞද්ධ ආරාම විනාශ කළා පමණක් නොව භික්ෂූන් වහන්සේලා ද ඝාතනය කළහ. මේ නිසා වත්පිළිවෙත් රැකීමට භික්ෂූන්ට නොහැකි විය. සුදු පිළි හැඳගත් මෙම කාලයේ සිටි පිරිස් දසසිල් ආරක්ෂා කරමින් ජීවත් වූහ. එම පිරිස් ගණන්නාන්සේලා ලෙස හැඳින්වුණි. මෙසේ භික්ෂු ශාසනය පසුබෑ අවධියක ගණින්නාන්සේලාගෙන් ඉටු වූ මෙහෙවර ඉතා වැදගත් වේ.

10. මහාවංශය, පරිච්ඡේදය 93, 10, 11 ගාථාව

ශාසනික විලෝපනය නිසා භික්ෂූන් වහන්සේලාගේත් තත්ත්වය ඉතා කණගාටුදායක ලෙස පිරිහුණු බව පෙනේ. මෙයට පිළියම් යෙදීමට තීරණය කළ විමලධර්මසූරිය රජතුමා 1597 උපසම්පදාව අවශ්‍ය භික්ෂූන් 20ක් වත් ලංකාව තුළින් සොයාගත නොහැකි වූ නිසා රක්ඛංග දේශයට දූත පිරිස් යවා නන්දිචක්ක චන්ද සීල මහා තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා වැඩමකරවා ගැටමේ උදක්කුක්ඛේපනී සීමාවන් තනා උපසම්පදා කර්මය පැවැත්විය.[11] පරිහානිය කරා ගමන් කර භික්ෂු ශාසනය යලි පැන නැගීමත් වර්ධනයත් විය. ඒ අනුව උඩරට වෙහෙර විහාර නඩත්තු කර භික්ෂූන්ගේ අභිවෘද්ධිය ඇතිකරනු ලැබීය. උඩරටට සාපේක්ෂව කතෝලික මිෂනාරීන් සමග බෞද්ධයින් සිය ආගමික අනන්‍යතාව පවත්වාගෙන යාමට ගත් උත්සාහයේ දී ඔවුහු රජුගේ සහාය අපේක්ෂා කළ අතර, රජතුමා ද එය නොමඳව ලබාදී ඇත.

විමලධර්මසූරියගෙන් පසු කන්ද උඩරට වැදගත් රජතුමා වූයේ දෙවන රාජසිංහ රජතුමා වුව ද, ඔහුගේ රාජ්‍ය කාලයෙන් වැඩි කොටසක් ගතවූයේ ප්‍රතිකාලුන් මුහුදුබඩ පළාත් වලින් එළවා දැමීමට ය. ඔහු ඒ සඳහා ආධාරයට කැඳවාගත් ඕලන්ද ජාතිකයෝ ප්‍රතිකාලුන් පාලන බලය භුක්ති විඳීමට ක්‍රියාකරනු දුටු හෙතෙම ඔවුනගේ කටයුතු වෙරළබඩ තීරයට පමණක් සීමා කිරීමට දැඩි උත්සාහයක් ගත්තෝය. මෙම තත්ත්වය නිසා භික්ෂු අධ්‍යාපනය පිරිහී භික්ෂු සංවිධානය වඩාත් දුර්වල විය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලන බලය ලන්දේසීන් සතුවීම බුදු සසුනට එල්ල වූ තවත් තර්ජනයක් ලෙස පෙන්වා දිය හැකිය.[12] උඩරට අනාරක්ෂිත නිසා රුහුණට පලා ආ භික්ෂූන්ට ඉන් සිදුවූයේ අනපේක්ෂිත ප්‍රශ්නවලට මුහුණ දීමටය. ලන්දේසීහු පෘතුගීසීන්ට වඩා දරුණු අන්දමින් ආගමික මර්දනය දියත් කළහ. මෙය බුදුදහමට පමණක් නොව කතෝලික ආගමට ද බල පෑවේය. 1682 බෞද්ධාගම හා බෞද්ධ වත් පිළිවෙත් පැවැත්වී මටත් නීති විරෝධී බවට ප්‍රකාශයට පත් කරමින් ආඥාවක් නිකුත් කිරීම ඊට කදිම නිදසුනකි.[13]

ලංකා ඉතිහාසයේ කිසි දිනක මුහුණ නොදුන් අපහසුතාවන්ට ලාංකික භික්ෂුව පත්වූ ආකාරය වටහාගත හැකිය. අතීතයේදී රජු එරෙහි වන විට ජනතාව භික්ෂුවගේ පැත්තේ සිටි අතර ජනතාව අසීරුවට පත්වන අවස්ථාවේ දී රජතුමා භික්ෂුවගේ සහයට ඉදිරිපත් වීම සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්ව තිබිණි. මින් පෙර නොවූ

11 ප්‍රබුද්ධ 2 පිටු, 276

12. හේමාසිරි හිමි, සී. රුහුණු සංඝ සංවිධානය මාතර බෝධි ආරක්ෂක සභාව, පිටු 275

13. මහින්ද, උණබුවුලේ සම්මුති, 1, දීපනි ප්‍රින්ටර්ස්, ගම්පහ , 2000 පිටු 275

අන්දමින් සංඝ සමාජය පිරිහී ගියේ එබඳු වාතාවරණයක් තුළය. [14] මෙම කාලයේ සංඝ සමාජයේ ස්වරූපය බලන විට සංඝ යන උත්තරීතර පදවියෙන් ඉවත්වූ ගිහිකමටත්, පැවිදිකමටත් නැති භික්ෂු පිරිසක් මේ කාලයේ වූහ. ඔවුන් ගණින්නාන්සේලා ලෙස හැඳින්වුණු සිවුරක් පොරවාගෙන ඊට උඩින් පටියක් බැඳීම ඔවුන්ගේ සාමාන්‍ය ඇඳුම වූ අතර සමහරුන් යටත් කසාවතක් හැඳ ඊට උඩින් සුදු රෙද්දක් ඇඳි බව පෙනේ. [15] සංඝරජවතෙහි දැක්වෙන අන්දමට ඔවුන් අඹුදරුවන් පෝෂණය කිරීමෙහි ද යෙදී ඇත. වැඩපලෙහි නිරත වීමත්, ස්ත්‍රීන් සරණපාවා ගැනීම හා වැඩපළෙහි නිරත වීම තහනම් වූ බවට රොබට් නොක්ස් සඳහන් කරයි. [16]

ප්‍රතිකාල් පාලන සමයේ දී බෞද්ධ වත් පිළිවෙත් පවත්වාගෙන යාමට ගණින්නාන්සේලාගෙන් ලැබුනු මෙහෙය ඉතා වැදගත් වේ. පාලි, සිංහල, සංස්කෘත භාෂා හා උසස් විද්‍යාත්මක තාක්ෂණික දැනුම ඇතුළත් පොතපත ආරක්ෂා කිරීමට ඔවුහු දායක වූහ. ක්‍රිස්තියානි පීඩනය යටතේ වුව ද මෙම බෞද්ධාගමික කටයුතු අඛණ්ඩ ව කරගෙන යන ලදී. ඔවුන්ට අමතරව දේශීය වෛද්‍යවරු ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යරක්ෂිත කටයුතුවල යෙදෙමින් පැරණි ශාස්ත්‍රීය දැනුම ආරක්ෂා කිරීමට ද ඇප කැප වූහ. පැරණි දැනුම ආරක්ෂා කළ තවත් කොටසක් වූයේ විදේශීය පාලකයන්ට ඇම්බට්ටකම් කළ දේශීය මුලාදෑනි පන්තියයි. තනතුරු හා ඉඩකඩම් ලබාගැනීම සඳහා ඔවුන් ක්‍රිස්තියානි ආගම වැළඳගත්ත ද බෞද්ධ ජීවන ක්‍රමය සම්පූර්ණයෙන් ම අත් නොහළහ. එනිසා 17-18 සියවස් වල සාහිත්‍යය කලාවේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාකළ විශාල පිරිසක් මුලාදෑනි අතර වූහ.

මෙසේ කටයුතු සිදු වෙද්දී ජනතාව උඩරට රජතුමා සමග සමීප ව ක්‍රියාකරන්නට විය. මේ සම්බන්ධතාවට නොදෙවැනි ආකාරයෙන් උඩරට භික්ෂූන් වහන්සේලා සහ පහතරට ගණින්නාන්සේලා අතර සබඳතාව වර්ධනය විය. උඩරට රාජ්‍ය නිදහස් රාජ්‍යයක් වශයෙන් පැවතීමෙන් එහි පාලකයා බෞද්ධාගමේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටීමත් නිසා උඩරට රාජ්‍යය ආසන්න මුහුදුමඩ පලාත්වල බෞද්ධ කටයුතු ක්‍රියාත්මක විය. දෙවන රාජසිංහට පසුව සිහසුනට පත්වූයේ දෙවන විමලධර්මසූරිය රජතුමායි. මොහු ලන්දේසින් සමග තරමක සහනශීලි භාවයකින් කටයුතු කළ අතර විනාශ කළ බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කළේය.

14.Sri L anka Nation Ardchires P 22-40
15. භික්ෂුවගේ උරුමය , පිටු 45
16. සරණංකර සංඝරාජ සමය, පිටු 58

බුද්ධ ශාසනය ශක්තිමත් පදනමකින් පවත්වාගෙන යාමට රාජකීය අධීක්ෂණය අවශ්‍ය වූයේ භික්ෂූන් සතු මාධ්‍ය සංවිධානයක් නොවීම නිසාය. ශාසනය සම්බන්ධයෙන් ගන්නා තීරණ භික්ෂු සමාජය විසින් සාකච්ඡා කොට තීරණය කළ යුතුවිය. දෙවැනි රාජසිංහ රජතුමා බිසෝවරු සහ නරපතීන් ගෙන්වූයේ ඉන්දියාවෙනි. එකී දේවීන් වහන්සේලා උප්පත්තියෙන් හින්දු ආගමික වූ අතර සිංහල රජකුගේ බිසවුන් මෙන් බෞද්ධාගමේ උන්නතිය සඳහා කෙරෙන සේවාවන් ඔවුන් හරහා ඉටු නොවීය. සමාජයේ පැවති අර්බුදකාරී තත්වය නිසා භික්ෂූන් අතර ද ගුණ දහම් පිරිහී ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1697 රක්ඛංග දේශයෙන් උපසම්පදාව ගෙන්වා යලි පහතරට සහ උඩරට භික්ෂු ශාසනය නගා සිටුවීමට පියවර ගත්තේය.

දෙවන විමලධර්මසූරිය රජතුමාගෙන් පසු වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා සිංහාසනාරූඪ වීමත් සමග බෞද්ධාගමේ මෙන් ම කතෝලික ආගමේ ද විශාල වර්ධනයක් ඇති විය. දකුණු ඉන්දියානු ජාතික කතෝලික ගොන්සල්වේස් පියතුමා රජුගේ සිත දිනාගනිමින් කතෝලික ආගමේ අභිවෘද්ධියට රාජ අනුග්‍රහය ලබගනු ලැබීය. රජතුමා හා බෞද්ධයන් තුළ වූ අන්‍යාගමික ඉවසීමේ පුරුද්ද හා අන්‍ය ආගම්වලට ගරු කිරීම වැරදි ලෙස හැඳින ගත් කතෝලික පූජකවරු හිතාමතා ම බෞද්ධ කටයුතු අවතක්සේරු කළහ. මෙම තත්ත්වය තුළ රාජාණ්ඩුවේ බලය බිඳ වැටෙන විට භික්ෂු සංවිධානය දුර්වල වී රජුන් හා ප්‍රභූන් සතු දේපළ ගැන වැඩි සැලකිල්ලක් දක්වූ භික්ෂු පරපුරක් වර්ධනය විය. එනමුත් උඩරටට සාපේක්ෂව පහතරට ප්‍රදේශයේ ජරා ජීර්ණ වූ විහාරාරාම ප්‍රතිසංස්කරණය කර ගණින්නාන්සේලාගේ දායකත්වයයෙන් ආගමික කටයුතු ප්‍රබෝධමත් වන්නට විය. විශේෂයෙන් ම දහ අට වන සියවස ආරම්භ වන විට හම්බන්තොට, මාතර, ගාල්ල ආදී දිස්ත්‍රික්ක කේන්ද්‍ර ගත කර ගනිමින් පැහැදිළි බෞද්ධ ප්‍රබෝධයක් වර්ධනය විය. මුල්කිරිගල විහාරය කේන්ද්‍ර කර ගනිමින් බෞද්ධ කටයුතු ප්‍රබල ලෙස ව්‍යාප්ත වී ඇති බව පෙනේ. මුල්කිරිගල විහාරය ගණින්නාන්සේලාට වඩාත් ආරක්ෂිත ස්ථානයක් විය. ගණින්නාන්සේලාගේ දායකත්වය නිසා ආගම දහම පමණක් නොව ගිහියන්ගේ අවශ්‍යතාවන් ද සපුරා දීමට ඔවුන්ට අවස්ථාව උදා විය.

මෙම අඳුරු පසුබිම යටතේ මහනුවර යුගයේ ශාසනික තොරතුරු පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ වැලිවිට සරණංකර හිමියන්ගේ බිහි වීමෙන් ලක්දිව බුද්ධ ශාසනයේ නව ප්‍රබෝධයක් ඇති වීමට ඉවහල් විය. එම

---

17. නොක්ස් රොබට්, එදා හෙළදිව, එච්. කරුණාරත්න, ගුණසේන සහ සමාගම, කොළඹ 1997 පිටු 224

නිසා ධර්ම ශාස්ත්‍රීය මෙන් ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පුනර්ජීවනයක් වර්ධනය විය. කථේන්ද්‍රසිංහ රජුගේ ආධාරයෙන් සරණංකර හිමියන් විසින් නියම කන්දේ ආරම්භ කරන ලද අධ්‍යාපනික ආයතනය හරහා ඇති කරණු ලැබූ ශාසනික ප්‍රබෝධය සම්බුද්ධ ශාසනයේත් සිංහල ජාතියේත් අභිවෘද්ධිය ඇති කිරීමට හේතු විය. සංඝරාජ හිමියන් දවස සිදු වූ විශේෂිත ම ශාසනික සිද්ධිය නම් සියම් උපසම්පදාව ලබා ගැනීම බව පැහැදිළිය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස එනම් 1753 දී සියමයෙන් මෙහි වැඩම කළ උපාලි හිමියන් ප්‍රධාන සූවිසි නමක් මල්වතු පෝය මලු විහාරයේ දී ප්‍රථම උපසම්පදාව සිදු කිරීමෙන් මෙහි ශාසනය ස්ථාපිත කිරීම ඉතා වැදගත් වූ ඓතිහාසික සිද්ධියකි. මෙම ඓතිහාසික සිදුවීමත් සමග මල්වතු අස්ගිරියේ උභය විහාරය සාමණේරයන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් උපසම්පදා කිරීමෙන් ශාසනය යලි ප්‍රබෝධවත් විය. [18] විශේෂයෙන් ම සංඝරාජ හිමියන් හට සංඝරා පදවිය පිරිනැමීම හා ශාස්ත්‍ර ලෝකය පැතිර වීම සඳහා රිදී විහාරය, දඹුලු විහාරය, දෙගල්දොරුව, අටමස්ථානය, මාතර, කළුගල හා පැල්මඩුල්ල ආදී ප්‍රදේශවල පිරිවෙන් ඇති කිරීම හා මතුවටත් ශාසනයේ ආරක්ෂාව පරිදි ජාති කුල භේදවලින් තොරව ලක්දිව භික්ෂු ශාසනය පුනර්ජීවනය විය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සහ වැලිවිට හිමියන්ගේ අභාවය සිදුවීමත් සමග උඩරට රාජධානියේ අභාවය ක්‍රමයෙන් වර්ධනය විය. 1815 උඩරට රාජධානිය බිඳ වැටෙන තෙක් උඩරට රාජ්‍ය නායක්කාර් වංශිකයින් සතුවූවත් සෙසු ප්‍රදේශයන් ලන්දේසින් විසින් පාලනය කරනු ලැබීය. රාජදිරාජසිංහ උඩරට බුද්ධ ශාසනය ගොඩ නැගීමට පියවර ගත්ත ද, එය එතරම් සාර්ථක නොවීය. අනතුරුව රාජත්වයට පත්වූ ශ්‍රී වික්‍රම රාජසිංහ යුගය අභ්‍යන්තර හා බාහිර වියවුල් නිසා අතිශයින් ම නොසන්සුන් පාලන කාලයක් වූ අතර ආගමික අතින් බලන කළ මෙම රජුගෙන් බුදු සසුනට ප්‍රමාණවත් සේවාවක් නොවීය. රජුගේ අත්තෝමතික පාලනයත් බුද්ධ ශාසනය සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙතත් ජනතාවගේ සිත් වේදනාවට හේතු විය. අවසන් වකවානුවේ පැවති බල අරගලය හා කැරලි කෝලාහල නිසා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ බිඳ වැටී 1815 දී එහි අවසන් ප්‍රතිඵලය වූයේ උඩරට යටත් වීමයි.

දාසයවන දාහත්වන සහ දහ අටවන සියවසේ දී මුදුහුබඩ පළාත් විදේශිකයින්ගේ ග්‍රහණයට හසුව තිබුණත් කන්ද උඩරට රාජධානිය හරහා සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා වෙමින් පැවතිනි. එහෙත් මුළු රට ම

18. Gunawardana K. W. Dutch Policy in Ceylon, 1990 , p. 335

යුරෝපීය ජාතිකයිනගේ ආධිපත්‍යයට යට වූ කල්හි මෙම තත්ත්වය වෙනස් විය. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් යටත් කරගනු ලැබූ උඩරට ප්‍රදේශවල සමාජ ප්‍රතිපත්තිය සකස් කර ගැනීමෙහිලා සමකාලීන සිංහලයින්ගේ දේශපාලනික හා නොයෙකුත් ප්‍රායෝගික අවශ්‍යතා බලපෑවේය. එකල එංගලන්තයේ සිටි ඉවැන්ජලිකල්වාදීන් උපයෝගිතාවාදීන් සමානත්වය පිළිබඳ අදහස් දක්වූ අතර ඔවුහු සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් වඩාත් මානුෂික වූහ. මෙම සංකල්පයන් පෙරටු කොට ගෙන සිය ප්‍රතිපත්තිය සැකසූ අතර අනෙක් අතට යටත් විජිතවල උද්ගත වූ ප්‍රශ්නවලට ස්වකීය දේශපාලන අධිරාජ්‍යයට තර්ජනයක් නොවන ආකාරයෙන් සුවිශේෂී විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය. ප්‍රධාන වශයෙන් ආගම සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිය වඩාත් සංකීර්ණ විය. එයට ඉවහල් වූයේ යටත් විජිතවල ස්වදේශිකයන්ගේ තත්ත්වය නැංවීම සඳහා ඔවුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමට ක්‍රියා කළ යුතු යැයි අවංකව හා දැඩි ව විශ්වාස කිරීමයි. ඔවුන් බුද්ධාගම මිත්‍යා දෘෂ්ටික ආගමක් ලෙස විශ්වාස කරන ලදී. එහෙත් ලංකාවේ බ්‍රිතාන්‍ය පාලකවරු දේශීය ආගම් සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීමට බොහෝ සෙයින් පසු බට වූහ.[19] 1815 දී උඩරට රාජ්‍යය බ්‍රිතාන්‍යන් හට පවරා දුන් අවස්ථාවේ දී ඔවුන් විසින් බෞද්ධාගම සම්බන්ධයෙන් කුමන පිළිවෙතක් අනුගමනය කළ යුතු ද යන සංකීර්ණ ප්‍රශ්නය මතු විය. දේශපාලන ආර්ථික කරුණු සඳහන් කරමින් බුද්ධාගම හා සංඝ සංවිධානය උඩරට දේශපාලකයන් එහි සමාජයේ හිමිකරගෙන තිබූ වැදගත් ස්ථාන සමග ඉටු කළ කාර්යය භාරය අනිවාර්යයෙන් ම සැලකිල්ලට ගැනීමට ඔවුන්ට සිදු විය.

ඒ අනුව භික්ෂූන් වහන්සේලා ඇමතු බ්‍රවුන්රිග් ආණ්ඩුකාර තුමා බෞද්ධාගමටත් භික්ෂූන්වහන්සේලාටත් සම්පූර්ණ රැකවරණය හා ආරක්ෂාව සැලසෙන බව සහතික කොට පැවසීය. ඉන් අනතුරුව භික්ෂූන් හා අධිකාරම්වරු ප්‍රමුඛ නිළමේවරු මගුල් මඩුවට රැස්ව මතභේදයට තුඩු දුන් ඓතිහාසික ගිවිසුම අත්සන් කළහ. විශේෂයෙන් ම මෙම ගිවිසුමේ වැදගත් වගන්තිය වූයේ පස්වන වගන්තියයි. දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් නොයෙක් මතවාද වර්ධනය වීම සඳහා එය බෙහෙවින් උපකාරී වූ බව පෙනේ.

ගිවිසුම අත්සන් කොට එපමණ කාලයක් යාමට පෙර බ්‍රිතාන්‍යයේ බෞද්ධාගම හා සෙසු දෑ සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙතෙහි නොයෙක් දුර්වලතාවන් වර්ධනය වූ අතර ඒ බව උඩරට නිළමේවරුන්ට මෙන් ම භික්ෂූන් බොහෝ දෙනෙකුට ප්‍රත්‍යක්ෂ විය. 1818 කැරැල්ල පැන නැගීමට හේතු ගණනාවක් දක්විය

19. සිංහල විශ්ව කෝෂය, 4 වන කාණ්ඩය, කොළඹ, 1970 පිටු. 173.

හැකි නමුදු ජාතික හා ආගමික සම්ප්‍රදායන් විදේශීය පාලනය යටත් ක්‍රමයෙන් බිඳ වැටෙනු දකීම එහි හේතු අතර එකක් වූ බව පැහැදිලිය. කැරැල්ල ඇති වීමත් සමග එය මර්දනය කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබීය. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ඉංග්‍රීසින් බෞද්ධාගම් ආරක්ෂාව තහවුරු කෙරෙන වගන්තියට කොන්දේසි එකතු කිරීමට වග බලා ගත්හ. ඒ අනුව 1818 දී නිකුත් කළ ප්‍රකාශයට අනුව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමාගේ මනදොළ සංසිඳන ආකාරයෙන් 1815 ගිවිසුමේ වගන්ති සංශෝධනය කිරීම සඳහා පියවර ගනු ලැබීය.

19 වන සියවස වන විට යුරෝපයේ විශේෂයෙන් ම එංගලන්තයේ ජන සම්මත වාදී අදහස් පැතිරෙමින් තිබූ හෙයින් පෘතුදීසින් හා ලන්දේසින් මෙන්ම දේශීය ආගම් මර්දනය කිරීමේ පිළිවෙතක් ක්‍රියාත්මක කිරීමට ඉංග්‍රීසින් හට නොහැකි විය. එම තත්ත්වය තුළ යටත් විජිතයන්හි ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත වූයේ රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් නොව පෞද්ගලික සංවිධානයක් විසින් ගෙන යන ලද ව්‍යාපාරයක් ලෙසිනි. දේශීය ජනතාව මිත්‍යාදෘෂ්ටික ග්‍රහණයෙන් මුදවාගෙන ඔවුන් දෙවියන් වහන්සේ කරා යොමු කරවීම ඒකායන අරමුණක් වශයෙන් හැඳිනගෙන තිබිණි. ක්‍රිස්තියානි රජයක් බෞද්ධාගමේ වත් පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා ගෙනයනු ලබන ප්‍රතිපත්තියට එරෙහි ව දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද දැඩි විරෝධතාවයක් වර්ධනය විය. මෙහි පෙරමුණ ගෙන ක්‍රියා කලේ කතෝලික මිෂනාරිය. විශේෂයෙන් ම මිෂනාරීහුය. උද්ඝෝෂණ උග්‍ර ව පැවති 1840 ගණන් වලදී බ්‍රිතාන්‍ය රාජ්‍යය බෞද්ධාගමික කටයුතුවලට මැදිහත් වූ ආකාරය පිළිබඳ විවරණයක් එමන්සන් ටෙනන්ට පෙන්වා ඇත. [20] එනම්,

1. රජයේ නිලධාරීන් බෞද්ධාගමේ කටයුතුවලට සහභාගී වීම.
2. බෞද්ධ භික්ෂූන්ගේ පැවැත්ම සඳහා බෞද්ධයන්ගේ වාර්ෂික උත්සව පැවැත්වීම පිණිස රජයේ මුදල් වෙන් කිරීම.
3. නායක පදවිවලට විහාරාධිපති පදවිවලට රජය මගින් භික්ෂූන් පත්කිරීම හා දේවාලවල බස්නායකවරු පත් කිරීම.

යන කරුණු නිසා බෞද්ධාගමේ අභිවෘද්ධියට මැදිහත් වීම පිළිබඳ නොයෙක් මතවාදයන් වර්ධනය විය. මෙම මිෂනාරි උද්ඝෝෂණ ප්‍රථම වරට කළ එළි දුටුවේ වෙස්ලියන් පූජකයකු වූ ස්පෙන්සර් හාඩිගේ "බ්‍රිතාන්‍ය රජය හා ලංකාවේ ප්‍රතිමා වන්දනාව" නම් ග්‍රන්ථය පළවීමෙන් පසුවය. [21] ස්පෙන්සර් හාඩි පමණක් නොව දහනමවන සියවසේ ජීවත්වූ මිෂනාරීන් හැම දෙනා ම පාහේ පෙරදිග සෑම ආගමක් වාගේ ප්‍රතිමා වන්දනය කරන මිත්‍යා දෘෂ්ටිකයන් වශයෙන් හැඳින්වූ අතර එවැනි ආගම් සමග ක්‍රිස්තියානි රජයක් මගින් අතිකර ගත්

සම්බන්ධකම් කවර විදිහේ සම්බන්ධතාවකින් ඇති කර ගත්තක් වුව ද ඒ ගැන හෝ ඉන් ඇති වන ප්‍රතිඵල ගැන නොසලකා කඩා බිඳ දැමීම අවශ්‍ය බව කල්පනා කළහ. [22]

සිංහල ජනතාව තුළ බිඳීම ඇතිකර ඒ තුළින් ක්‍රමවත් පාලනයක් ගෙන යාමට නම් බෞද්ධාගම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පිළිවෙත වහා ම අත්හළ යුතු බවට මතයක් වර්ධනය විය. විශේෂයෙන් ම බුදු දහම තුළින් ආක්‍රමණවාදී හෝ ව්‍යාප්ත වාදී පිළිවෙතක් උගන්වන්නේ නැත. සිය ලබ්දිය පැතිරවීම සඳහා යුද්ධ සංග්‍රාමයෙහි නිරත වීමක් බුදු සමයේ ඉතිහාසය තුළ කිසි විටෙක හෝ දක්නට නොලැබේ. මේ නිසා ආගම මඟින් ජනතාවට සහනශීලි භාවයක් දක්නට ලැබුණි. විශේෂයෙන් ම මෙම පදනම පැහැර හැරීමේ අරමුණින් මිෂනාරීහු වහ වහා ක්‍රියාත්මක වන්නට වූහ.

සිංහලයා පුරාණයේ සිට ම ආගන්තුක සත්කාර සඳහා ඉතා ඉහළ වටිනාමකම් ලබා දුන් පිරිසකි. යුරෝපීයන් මෙරටට පැමිණ කිතු දහම ව්‍යාප්ත කිරීමේ දී මේ සඳහා ඔවුන්ට භික්ෂූන්ගෙන් නොමසුරු සහයක් ලැබුණු බව පෙනේ. "ජේම්ස් සෙල්කරක් " නම් පූජකතුමා "ලංකාව ගැන මතක සටහන් " යන නමින් 1844 දී පළ කළ පොතෙහි ඒ අවදියේ භික්ෂූන් වහන්සේලා විසින් ලබ්දිය කෙරෙහි සාමාන්‍යයෙන් දැක්වූ ආකල්ප වඩාත් පැහැදිලි වේ. කෝට්ටේ පිහිටි චර්ච් මිෂනාරි සොසයිටි නැමැති මිෂනාරි මධ්‍යස්ථානයේ නැවතී සිටි සෙල්කරත් භික්ෂූන් වහන්සේලා මුණගැසී සිය ආගමික මතවාදයන් ගැන සාකච්ඡා කළ බව පෙනේ. එයින් ගම්‍ය වන්නේ භික්ෂූන් වහන්සේලා මෙබඳු සහනශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කළේ විරාගත ව හුරු වී ඇති ගුණධර්ම නිසා බව පෙනේ.

මේ ආකාරයට බෞද්ධාගමට පහර ගැසීමේ ප්‍රතිපත්තිය සැකසීමෙන් පවතින විට නොයෙක් මිෂනාරී ආයතනවල ක්‍රියාකාරිත්වය ඉතා ප්‍රබල වූ බව පෙනේ. ඒ අතර 1804 දී ලන්ඩන් මිෂන් සොයටි, සංවිධානය 1812 බැප්ටිස්ට් මිෂන් සංවිධානය, 1814 වෙස්ලියන් මෙතඩිස්ට් මිෂන් සංවිධානය 1818 දී චර්ච් මිෂනාරී සංවිධානය මෙරටෙහි ශාඛා පිහිටුවා සිය ආගමික ව්‍යාපාරයේ නිරත විය. මීට අමතරව පෘතුගීසීන් පිහිටුවන ලද කතෝලික සභාවක් ලන්දේසීන්ගේ පෙපරමාදු

---

[illegible] ලයේ වාර්ෂික බෞද්ධ ප්‍රකාශන, 1983, පිටු 68.

21. ඉලංගසිංහ, මංගල, රාජ්‍ය හා ආගම කැළණි විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකි. පිටු. 131

22. එම, පිටු 131.

නිකායක් එකතුව බුදු සමය අවප්‍රමාණ කරමින් ක්‍රිස්තු ලබ්දිය ප්‍රචාරය කිරීම සඳහා නොයෙක් විධි ක්‍රියාමාර්ගයන් ගනු ලැබීය. ඉන් ප්‍රධානතම ක්‍රම උපාය වූයේ අධ්‍යාපන ක්‍රමය භාවිතා කිරීමය. රජය තුළ පැහැදිළි අධ්‍යාපන ප්‍රතිපත්තියක් නොවුණ බැවින්, ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමේ වගකීම විෂනාරීන්ට භාර වූ අතර දේශීය අධ්‍යාපන ක්‍රමයක් නොසලකමින් බෞද්ධ හා හින්දු දරුවන් ලාබාල වියේ සිට ම තමන් වෙත නම්මවා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක විය. ක්‍රිස්තු ලබ්ධිය ව්‍යාප්ත කිරීමට යොදාගත් උපක්‍රමය වූයේ මුද්‍රිත පත්‍රිකා බෙදා හැරීමය. බුදු සමය විවේචනය කරන අතර ක්‍රිස්තියානි ධර්මය උසස් බව මෙම පත්‍රිකා මගින් ප්‍රකාශ කරන ලදී. ඒවාගේ ම නවකථා ගීත, නාට්‍ය ආදී විනෝදාස්වාදය සපයන මාර්ග මගිනුත් ක්‍රිස්තියානි ලබ්ධිය ප්‍රචාරය කිරීමේ සංවිධාන පිහිටුවීම වැනි කටයුතු මගින් ආගම ව්‍යාප්ත කිරීමේ කාර්යයන් වේගවත් කර ඇත. [23]

ක්‍රිස්තියානි බලපෑම ඇතුලු යුරෝපයේ සංස්කෘතිය මේ ආකාරයෙන් මෙරට සමාජයේ පැතිර යත් ම තව දුරටත් ඉවසා දරා ගැනීමට දේශීයයන්ට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස එයට එරෙහි වූ ජාතික ව්‍යාපාර ද, ක්‍රමයෙන් ඇරඹෙන්නට විය. ඉන් පළමු ව දක්නට ලැබෙන්නේ ඉහත ප්‍රකාශ වූ උපේක්ෂා සහගත ආකල්පය ඉවත් වීමත් ක්‍රිස්තියානි ව්‍යාප්ති වාදයට විරෝධය දැක්වීමත් ය. [24] 1848 කැරැල්ල ඇතිවීම සඳහා පවතින ලද නව බදු මෙන් ම ආගමික හේතූන් ද බලපාන ලදී. පාරම්පරික දේශපාලන ක්‍රමය හා සමාජ සංස්කෘතික පුනරුත්තාපනය කර ගැනීමේ පරමාර්ථය 1823, 1834 හා 1832 සිදු වූ කුමන්ත්‍රණය හා කැරලි සංවිධාන ප්‍රයත්නයන්හි දක්නට ලැබිණි. [25] 1832 කුමන්ත්‍රණයේ දී ගංගාරාමයේ උඩුවේ හිමියෝ ද 1842 කුමන්ත්‍රණයේදී චන්ද්‍රජෝති නම් භික්ෂූන්වහන්සේට 1848 කැරැල්ලේ දී කුඩාපොල හිමියෝ ද බෞද්ධ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට ක්‍රියාකාරී වූහ. [26] භික්ෂූන්වහන්සේ ජාතික ආගමික උරුමය ප්‍රතිස්ථාපනය කිරීමේ කර්තව්‍යයේ නිරත වීම ශ්‍රී ලංකා ඉතිහාසයේ මීට පෙර ද අනුරාධපුර අවදියේ සිට ම දක්නට ලැබුණි. මෙම වකවානුවේ භික්ෂූන්ගේ ක්‍රියාකාරිත්වය වඩාත් වර්ධනය විය. කළුතර, පානදුර, මොරටුව ආදී ප්‍රදේශවල භික්ෂූන් ක්‍රිස්තියානියට එරෙහි ව නැගී සිටි බව ඩික්සන් නැමැති පූජකයා පෙන්වා දී ඇත. බෞද්ධ ආගමික ප්‍රබෝධය මුල් පියවර ලෙස

23. The British Government and The Idolatory of Ceylon., p. 171- 200

1842 දී වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් රත්මලානේ ශාස්ත්‍ර ශාලාව පිහිටුවීමත් සමග සිංහල බෞද්ධ පුනර්ජීවනයේ තෝතැන්නක් බවට පත්විය. සිංහල පාලි සංස්කෘතික පිළිබඳ නව ජීවයක් බුදු දහම හා බෞද්ධ සංස්කෘති, සාහිත්‍ය, අධ්‍යාපනයටත් ලබාදුනේ මෙම ආයතනයයි. සුමංගල හිමි, ධම්මාලෝක හිමි, ද සිල්වා, ඇපා අප්පුහාමි, කොග්ගල ධම්මතිලක හිමි, සුමනතිස්ස හිමි, ධම්මාලංකාර හිමි ආදී විද්වතුන් ජනිත කිරීම සඳහා ඉවු කරනු ලැබූ මෙහෙය ඉතා වැදගත් වේ. වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් 1862 දී ප්‍රථම සිංහල පුවත්පත වූ "ලක්මිණි පහන" ඇරඹිනි. මෙම වර්ෂයේ දී ම සියම් දේශයෙන් ලැබුණු ආධාර පදනම් කරගෙන ලංකාවේ ප්‍රථම මුද්‍රණාලය ආරම්භ විය. මෙපමණ කළ මිෂනාරීන් විසින් මුද්‍රණ පත්‍රිකා ආශ්‍රයෙන් නොයෙක් චෝදනාවන් බුදුදහමට එරෙහිව එල්ල කරනු ලැබුව ද එයට එරෙහි ව නැගී සිටීමට තරම් ශක්තියක් දේශිකයන්ට නොවුණ ද මුද්‍රණ ශිල්පය ආරම්භ කිරීමත් සමග එය වඩාත් වර්ධනය විය.

බෞද්ධ පුනරුදය පිළිබඳ කරුණු අධ්‍යනය කිරීමේ දී සිංහල ජාතික ප්‍රබෝධය වර්ධනය කළ තවත් අංගයක් වූයේ මිෂනාරීන් සමග ඇති වූ නොයෙකුත් වාද විවාදයන්ය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් පානදුරවාදය ද පසුව බද්දේගම, වරගොඩ, උදන්විට, ගම්පල ආදී වශයෙන් පංචමහා වාදයන් ඇතිවිය. මෙම වාදයන් මෙතෙක් නොවූ ආකාරයෙන් බුද්ධාගම ජනප්‍රිය වන්නට විය. සරණංකර හිමියන් හරහා උඩරට මෙන් ම පහතරට ඇති වූ බෞද්ධ ප්‍රබෝධය 19 වන සියවස වන විටත් ක්‍රමයෙන් බසුබැමට ලක් වුව ද, පංචමහා වාදය, සවි සත්දම් වාදය ආදිය ද, ජනප්‍රිය වීමත් සමග බෞද්ධ සාහිත්‍ය දියුණුවට ලක්වී ධර්ම ඥානය වර්ධනය විය. මෙම වාද විවාදයන් හරහා ගිහි පැවිදි විශාල පිරිසක් ජනිත වී පසුව ඔවුහු බෞද්ධ ප්‍රබෝධයේ ක්‍රියාකාරීන් බවට පත් වූහ. මුල්කාලයේ දී බුද්ධිය කේන්ද්‍ර කරගත් මතවාදයන් ගොඩනැගුණු ද, බෞද්ධයන් ක්‍රමයෙන් ශක්තිමත් වීමෙන් පසු නොයෙක් වාද විවාද පුවත්පත් සඟරා මගින් සිදු කර ඇත. සිංහල, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි සාහිත්‍යය පරිශීලනය කර විචාර බුද්ධිය වර්ධනය කර ගැනීමට හැකි විය. මෙම තත්ත්වය තුළ සිංහල භාෂාව නව සංකල්ප ප්‍රකාශයන් පොදු පාඨක ජනයාගේ රුචිකත්වයට සරිලන හැඩ ගැස්වීමක් නිසා පෙර තිබුණාට වඩා සුබනම්‍ය මාධ්‍යයක් බවට පත්විය.[27] සවිසත්දම් වාදය (1854) සිදත් සඟරා වාදය (1889)

---

24. Malalgoda K., The Buddhist Christion Confrontion in Ceylon P. 12-13
25. අපේ සංස්කෘතික උරුමය, (ප්‍රථම කාණ්ඩය) මධ්‍යම සංස්කෘතික අරමුදල, 1995 පිටු 245
26. සත්‍ය සමුච්චිය 1908, පිටු 39-40

ජාතකීහරණය වාදය (1891) ආදී වාදයන් 19 වන සියවසේ දෙවන භාගයේදී ඇතිවීම නිසා මහත් බුද්ධිමය කුතුහලයක් ජනිත කළ කාලයක් විය.

බ්‍රිතාන්‍ය පාලනය නිසා විශේෂයෙන් ම මිෂනාරීන්ගේ බලපෑම මත ස්වදේශීය අධ්‍යාපනය ක්‍රමයෙන් ගරා වැටුණු බවත් දක්නට ලැබිණි. එසේ පසුබෑමකට ලක්ව තිබූ පිරිවෙන් අධ්‍යාපනය නැවත වරක් පිබිදීමට ලක්වීම මෙම අවධියේ ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයේ තවත් විශේෂ ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. වලානේ සිද්ධාර්ථ හිමියන්ගෙන් ඇතිවූ ශාසනික ප්‍රබෝධය පසුව බෙන්තර අත්තදස්සී හිමියන් විසින් බෙන්තර වනවාසී විහාරය ද, අඹගහවත්තේ සරණංකර හිමි පයාගල විහාරය ද, වැලිගම සුමංගලහිමි පානදුරේ ද වාසය කරමින් භික්ෂූන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍ර ඥානය ලබා දුන් බව පෙනේ. [28] ඉන් අනතුරු ව පිරිවෙන් අධ්‍යාපනය නව මගකට යොමු වූයේ විටද්‍යාදය පිරිවෙන (1873) විද්‍යාලංකාර (1875) පිහිටුවීමෙත් සමග බ්‍රිතාන්‍යයන් දේශීය අධ්‍යාපනය නොසලකා සිටිය ද, එය වඩාත් පුලුල් වත් ම පසු අවදියේ දී මේ පිරිවෙන් සඳහා රජයේ සහය ද, ලැබුනු ආකාරයක් දිස් වේ. මෙම පිරිවෙන් ආරම්භ වීමට සාපේක්ෂව ලංකාවේ සෙසු ප්‍රදේශයන් හි ද තවදුරටත් පිරිවෙන් ආරම්භ වන්නට විය. පිරිවෙන් අධ්‍යාපනයේ ව්‍යාප්තිය සිංහල සංස්කෘතියේ උරුමයන් යළි එළි පෙහෙළි කර ගැනීමට තුඩු දුන් ප්‍රධාන සාධකයක් බවට පත්විය. 19 වන සියවසේ මම ආයතනයෙන් යලි පිහිටුවන ලදි. ඒවා වර්ධනය කරනු ලැබීම නව යුගයේ අවශ්‍යතා අනුව පාරම්පරික ආයතන යළි භාවිතයට ගැනීම මෙයින් සිදු විය.

මෙම අවධියේ ඇති වූ ශාසනික ප්‍රබෝධය පිළිබඳව අවධානය යොමු කරන විට ග්‍රන්ථ රචනා කිරීම මෙන් ම සංස්කරණය කිරීමක් ද, සිදු විය. සිදත් සඟරාව නව සන්නය, සියබස්ලකර, ධර්ම ප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ, මුව දෙව්දාවත ආදී සම්භාව්‍ය කෘති සංස්කරණය කොට පළ කිරීම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමට මෙන් ම සිංහල ජාතික උරුමය පොදු ජන විඥානය සඳහා පුබුදුවාලීමට හේතු වී ය. සිංහලයා ඉතිහාසය දෙසටත් අපගේ පැරණි ශිෂ්ඨාචාරය පිළිබඳ කරනු ලැබූ අධ්‍යයනය තුළින් සිංහලයාගේ ගෘහ නිර්මාණය, ප්‍රතිමා කලාව කැටයම් කලාව, වාරි තාක්ෂණය ආදී විශිෂ්ඨ කටයුතු ගැන ජාතික අභිමානයක් මේ අවධියේ දී වර්ධනය වන්නට විය.

---

27. රාහුල, වල්පොල භික්ෂුවගේ උරුමය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ 1992, පිටු. 87
28 සරත්චන්ද්‍ර එදිරිවීර, සිංහල, නවකථා, කොළඹ. ලේක් හවුස්, 1968, පිටු 10

ලංකාවේ මෙම අවධියේදී ඇතිවූ බෞද්ධ ප්‍රබෝධය දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන් ද, ව්‍යාප්ත වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ පැමිණීම ලක්දිව බෞද්ධ ප්‍රබෝධයට නව පනක් ලබාදීමට සමත්විය. යුරෝපයේ පැවති නව චින්තනයන් හා සංවිධාන විධික්‍රම බෞද්ධ ප්‍රබෝධයට නව පනක් ලබාදීමට සමත් විය. යුරෝපයේ පැවති නව චින්තනයන් හා සංවිධානව විධික්‍රම බෞද්ධ ප්‍රබෝධයේ අවශ්‍යතාවුන්ට උපකාරී වන ආකාරයෙන් ජාතික ආගමික ව්‍යාපාරයට තව තවත් පුළුල් කිරීමට පියවර ගත්තේ ය. පසුව පැමිණි බ්ලාවැට්ස්කි මැතිනියගේ ද සහාය ඇතිව 1880 පරම විඥාර්ථ බෞද්ධ සමාගම ද, ආරම්භ වී දේශීය වත් පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා විශාල පිටුවහලක් උදාවිය. සිංහල බෞද්ධ පාසැල් තව තවත් පුලුල් කර බෞද්ධාරක්ෂණ සංගමය පිහිටුවා බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පියවර ගත්තේ ය. බෞද්ධ පාසැල් ආරම්භ වීමත් සමග මිෂනාරීන්ට දැඩි අභියෝගයකකට මුහුණ දීමට සිදුවිය.

යටත් විජිත යුගයේ ජාතික ආගමික ප්‍රබෝධය ජනිත කිරීමෙහිලා ඉතා විශිෂ්ඨ කාර්ය කාර්යක් සාහිත්‍යධරයින් විසින් ඉටු කරනු ලැබීය. ප්‍රථම ජාතික ආගමික මෙහෙවර ඉටු කරනු ලද්දේ පුවත්පත් සඟරා සංස්කාරකවරුන් විසිනි. මුද්‍රණ ශිල්පය මිෂනාරීන් සතුව පැවති නිසා මාසික තෑග්ග, ලංකා නිධානය උරගල, ශාස්ත්‍ර නිධානය, ආදී ක්‍රිස්තියානි සඟරා පළවූ අතර එයට එරෙහිව 1854 වර්ෂයේදී බටුවන්තුඩාවේ ගේ සංස්කරණත්වයෙන් සිංහල ප්‍රථම සඟරාව ලෙස යතලබ සඟරාව පලවිය.[29] ත් අනතුරුව නොනැවතුණු බෞද්ධයෝ ලක්මිණි පහණ, දුර්ලබ්ධි විනෝදනීය සාරාර්ථ ප්‍රදීපිකාව ආදී සඟරා ආරම්භ කර තිබේ. ක්‍රිස්තියානි මතවාදයන් පරාජය කරමින් බෞද්ධ ආකල්පයන් වර්ධනය වීමත් සමග ජාතික ආගමික නැඹුරුවක් ඇතිවී තව දුරටත් පොත පත පළවන්නට විය. ඒ අතර සතර සමුච්චිය සමය, සංග්‍රහය ඥානාවභාෂය, දිනකර ප්‍රකාශය ආදී පුවත්පත් බිහි විය.

සිංහල පුවත්පත් ක්ෂේත්‍රයේ මේ ආකාර වර්ධනයක් සිදුවී මත් සමග නාට්‍ය කලා ආශ්‍රයෙන් ද ලැබුණෙ නොමද පන්නරයකි. සී දොන් බස්තියන්, බෙන්තොට ඇල්බට්, සයිමන්ද සිල්ව, ජෝන්ද සිල්වා, පියදාස සිරිසේන, ආදි විද්වතුන්ගෙන් මෙරට බෞද්ධ සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා නොමද සහයක් ලැබුණි. සිංහබා නූර්තිය, රෝමියෝ ජුලියට්, සුදාස සහ සාලතී කෞට් බෑනා, ස්වර්ණතිලක ආදී නාට්‍යය යුරෝපීය කථා ආශ්‍රයෙන් හෙළ සිරිත් විරිත් රැක ගැනීම සඳහා ක්‍රියාත්මක විය. දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන සිංහලුන්ගේ ඇඳුම් පැළඳුම් භාෂාව ආදී ගුණාංග ඉස්මතු කිරීමේ අරමුණින් ජෝන් ද සිල්වා නාට්‍යය 54ක්

ලියා නිෂ්පාදනය කරන ලදී. [30] ඒ අනතුරෙන් පරාක්‍රම බාහු, දෙවන රාජසිංහ, සිරිසගබෝ, වලගම්බා, මහානාම ආදී නාට්‍ය ඉතා ජනප්‍රිය ඒවා අතර විය. මිෂනාරීන් සිය ආගම ප්‍රචාරය කිරීම සඳහා ප්‍රබන්ධ කථා නිර්මාණය කරනු ලැබුවත් ඊට සමගාමීව සිංහලයන් විසින් ද පැරණි සංස්කෘතිය ඔප් නංවන ක්‍රියාමාර්ගයක් වෙත යොමු විය. ඒ අනුව විමලා, ආදර හසුන, සිරිබිරි වෙසක් දූතයා, මීනා, තෙරීසා, අපේ ආගම යන කථා දේශීය සංස්කෘතිය හුවා දක්වෙන මහඟු දායාදයක් බවට පත්විය. මෙම යුග පුරුෂයන්ගෙන් පමණක් නොව අනගාරික ධර්මපාල වලිසිංහ හරිස්චන්ද්‍ර වැනි ක්‍රියාශීලී ජන නායකයන්ගෙන් ජාතික අනුරාගය හා ආගම වර්ධනය වීම සඳහා පුළුල් දායකත්වයක් සිදුවූ බව පෙනේ.

මේ අනුව පැහැදිලි වන්නේ පෘතුගීසි හා ලන්දේසි යුගයේ දී නොයෙක් මත ගැටුම් හා බාධකයන්ට යටත් ව සංඝ ශාසනය විකාශනය විය. ඉන් අනතුරුව බ්‍රිතාන්‍ය යුගයේ දි මිෂනාරී අදහස් හා මතවාදයන් යටතේ බෞද්ධාගමේ පරිහානිය ක්‍රමිකව සිදු වූ අතර එයට එරෙහි ව බෞද්ධ ප්‍රබෝධයක් ද වර්ධනය වන්නට විය. බ්‍රිතාන්‍ය පාලනය යටතේ බටහිර ශිෂ්ටාචාරය මෙරට ව්‍යාප්ත කිරීමත් සමග යුගයේ අවශ්‍යතාවට ගැලපෙන ආකාරයෙන් අභියෝග ජය ගැනීම සඳහා ස්වදේශීය ගිහි පැවිදි ජාති හිතෛෂී උදාර යුගපුරුෂයන් ඉටු කළ මෙහෙවර ඉහතින් පැහැදිලි වේ.

---

29. ජයවර්ධන කුමාරි, ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 1972 පිටු. 43

30 ප්‍රඥාසේඛර, කටුකොඳයාමේ, සිංහල පුවත්පත් සගරා ඉතිහාසය, ගුණසේන සහ සමාගම, කොළඹ, 1965 පිටු, 78-142